# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/52 – 2023 ජනවාරි මස 05 වැනි බ්‍රහස්පතින්දා – 2023.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 මැයි මස 28 වැනි දින අංක 1812/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 168 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/222.
ඉඩම් අත්කර ගැනීමේ
නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/14.
2022 දෙසැම්බර් මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### I වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535 A - බෙල්ලන්විල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෙල්ලන්තර(බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අනුරේඛන අංක CO/KSB/2022/94 හා 2022.08.28 දිනැති පැහැදිලි කිරීමේ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'E' – මූණමල්ගහඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0422**

උතුරට: කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A; දකුණට: කැබලි අක්ෂර A, විහාර මාවතේ වරිපනම් අංක 4/2 දරන ඉඩම සහ විහාර මාවතේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම; බටහිරට: විහාර මාවතේ වරිපනම් අංක 4/2 දරන ඉඩම සහ විහාර මාවතේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම.

02. **කැබලි අක්ෂර 'F' – මූණමල්ගහඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0209**

උතුරට: කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A; දකුණට: විහාර මාවතේ වරිපනම් අංක 71/1 දරන ඉඩම සහ විහාර මාවතේ වරිපනම් අංකය සොයාගත නොහැකි කේ. මහේෂ් හිමිකම් කියන ඉඩම; බටහිරට: විහාර මාවතේ වරිපනම් අංකය සොයාගත නොහැකි කේ. මහේෂ් හිමිකම් කියන ඉඩම සහ පාර.

EOG 01 - 0030

1A – G 38498 – 14 (2023/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*